**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**

# රැකියා අවස්ථා

ISO 9001:2015 ජාත්‍යන්තර තත්ව සහතිකයෙන් පිදුම්ලත් ප්‍රධාන පෙළේ රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා පාලන) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධිය ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය සංස්ථාවක,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 18 ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතු වන අතර, ඉන් වසර තුනක් (03) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය. ඊට අමතරව කළමනාකරණය / මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- HM 1-3 - රු. 152,500 - 15 x 4,100 - 214,000/=
**වයස් සීමාව** :- අවුරුදු 35 ත් - 55 ත් අතර විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ

## 02. සහකාර සාමාන්‍යාධිකාරී (යන්ත්‍රෝපකරණ) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ තාක්ෂණවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය/ ලන්ඩන් ඉංජිනේරු සභාව/ ලන්ඩන් ඉංජිනේරු යන ආයතනයක යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ III වන අදියරේ විභාගය සමත්වී තිබීම

**සහ**

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සංස්ථාගත සාමාජිකත්වය හෝ ප්‍රවීන (Fellow) සාමාජිකත්වය ලබා තිබීම

**සමඟ**

මූලික උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තම විෂය ක්ෂේත්‍රයට අදාල තනතුරක අවම වශයෙන් වසර පහළොවක 15 ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංසථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- HM 1-1 - රු. 140,640 - 15 x 4,100 - 202,140/=
**වයස් සීමාව** :- අවුරුදු 35 ත් - 55 ත් අතර විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ

## 03. පරිගණක ඉංජිනේරු - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික ඉංජිනේරු උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාල වෙනත් ඕනෑම උපාධියක් සම්පූර්ණ කිරීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආශ්‍රිත සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) ආශ්‍රිත ඉංජිනේරුවරයකු ( A.Eng ) ලෙස ලියාපදිංචි වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- MM 1-1 රු. 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240/=
**වයස් සීමාව** :- අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ

## 04. අභ්‍යන්තර විගණන සහකාර 111 ශ්‍රේණිය - තනතුරු 01

**බාහිර / අභ්‍යන්තර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය හෝ වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනය (ICA) /වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනය (CIMA) / වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) අන්තර් මාධ්‍ය විභාගයෙන් සමත් වී තිබීම.

## 05. සැපයුම් සහකාර සහකාර 111 ශ්‍රේණිය - තනතුරු 03
## 06. ගබඩා සහකාර 111 ශ්‍රේණිය - තනතුරු 02
## 07. පාලන සහකාර 111 ශ්‍රේණිය - තනතුරු 01
## 08. විමර්ශන සහකාර 111 ශ්‍රේණිය - තනතුරු 01
## 09. ඉඩම් සහකාර 111 ශ්‍රේණිය - තනතුරු 03

**බාහිර / අභ්‍යන්තර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධියක් ලබා තිබීම. (අදාල ක්ෂේත්‍රයේ උපාධියක් ලබා ඇති අයට ප්‍රමුඛතාවය හිමිවනු ඇත)

## 10. අලෙවිකරණ සහකාර 111 ශ්‍රේණිය - තනතුරු 02

**බාහිර / අභ්‍යන්තර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් අලෙවි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබිම.

**වැටුප් පරිමාණය** :- MA 03 - රු. 53,940 - 10 x 800 – 11 x 1,190 – 10 x 1,320 – 5 x 1,350 – 94,980/=
**වයස් සීමාව** :- අවුරුදු 22 ත් - 45 ත් අතර විය යුතුය.

## 11. බලාත්මක කිරීමේ සහකාර - තනතුරු 06

**බාහිර අයදුම්කරුවන්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් තාක්ෂණික පුහුණු කිරීමේ ආයතනයකින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු හෝ ඉඩම් අත්පත් කරගැනීමේ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම 04 වන මට්ටමට (NVQ Level 04) නොඅඩු ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කිරීමෙන් පසුව අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාල සුදුසුකම පිළිබඳව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් පරීක්ෂා කරගත හැකිය.

**වැටුප් පරිමාණය** :- MA 2-2 රු. 50,540 - 10 x 540 - 7 x 630 - 4x 1,080 - 20 x 1,280 - 90,270/=
**වයස් සීමාව** :- අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව, සම්පූර්ණ වැටුප පරිමාණය මත ගෙවීම් සිදුකිරීම 2027.01.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වනු ඇත.

සියලුම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ පහත සඳහන් ලිපිනයට **2026.04.02 හෝ ඊට පෙර** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් කරන තනතුරෙහි නම අදාල ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරෙහි පැහැදිළිව සඳහන් කල යුතුය. අදාල අයදුම්පත්‍රය www.landdevelopment.lk වෙබ් අඩවිය ඔස්සේ බාගත කළ හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන),**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**

රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක දැනටමත් සේවයේ නියුතු අය තමන්ගේ ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර, අයදුම්කරු අදාල තනතුරට තෝරා ගතහොත් එම තනතුරෙහි වැඩ භාර ගැනීම සඳහා අදාල ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**
**වෙබ් අඩවිය** - www.landdevelopment.lk